**සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදල - 2021**
**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

සමෘද්ධි සමාජ සංවර්ධන භාරකාර අරමුදලේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරික්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරිත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරි බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‘‘මනාලෙස සැලසුම් කරන ලද’’ අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ. පොදු ලෙජරය, ජර්නලය, ජර්නල් වවුචර්, ගෙවීම් වවුචර් ආදී ප්‍රධාන ගිණුම්කරණ වාර්තා පවත්වාගෙන යාම සම්බන්ධ විගණන නිරීක්ෂණ ඇතුළත් කර ඇත.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී මුදල් පොත් හැර ඊට අදාළ ලෙජර් ගිණුම්, ජ'නල් ඇතුළු ගිණුම් පොත්පත් පවත්වාගෙන ගොස් නොතිබුණි. | 2022 වර්ෂයේ සිට ලෙජරය ගිණුම් ඇතුළු අනෙකුත් පොත්පත් පවත්වා ගෙනයාමට කටයුතු කර ඇත. | ප්‍රධාන ගිණුම් පොත් නිසි පරිදි පවත්වා ගත යුතුයි. |

### 1.5.2 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 57 ඡේදය ප්‍රකාරව, මුළු පිරිවැය රු.126,255,800 ක් වූ නිලාවෙලී පුහුණු මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහිත අක්කර 7 පර්චස් 37 ක ඉඩම, ඉඩම් හා ගොඩනැඟිලි වශයෙන් වෙන් වෙන්ව හඳුනානොගෙන ගොඩනැඟිලි ක්ෂය වටිනාකම ගණනය කර ගිණුම් ගත කර තිබුණි. | මධ්‍යස්ථාන ගොඩනැගිල්ල සහ ඉඩම මෙම වර්ෂය තුළ වෙන් වෙන් වශයෙන් තක්සේරු කර ක්ෂය කිරීම් ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත ප්‍රකාරව ගිණුම් පිළියෙල කළ යුතුය. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් යටතේ කාර්යාල උපකරණ ලෙස දිස්ත්‍රික්ක 13 කට අදාළව එකතුව රු. 1,248,798 ක හඳුනා නොගත් ශේෂයක් 1998 වර්ෂයේ සිට ඉදිරියට ගෙනා ශේෂයක් වශයෙන් දක්වා තිබුණි. එම වත්කම්වල වාර්ෂික ක්ෂය වටිනාකම රු. 10,452, ක් වූ අතර සමුච්චිත ක්ෂය වටිනාකම රු. 1,154,725 ක් විය. | හඳුනානොගත් ශේෂයන් වශයෙන් ඉදිරියට ගෙනවිත් ඇති ශේෂයන් දිස්ත්‍රික් වශයෙන් පරීක්ෂා කර ඉදිරියේ දී නිවැරදි කිරීම සඳහා කටයුතු කරනු ලැබේ. | වත්කම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කල යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගමන් වියදම් හා අතිකාල දීමනා වටිනාකම රු. 46,598 ක් හා 2021 වර්ෂයේ ගෙවීමට නොහැකිව ඉතිරි වූ ප්‍රතිලාභී ඉල්ලුම්පත් සඳහා ගෙවිය යුතු රු. 8,784,247 ක් උපචිත වියදම් ලෙස ගිණුම් ගත කර නොතිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ඌණතාවය සහ ජංගම වගකීම් රු. 8,830,845 ක් අඩුවෙන් දැක්වුණි. | 2021 වර්ෂයේ අවසන් ගිණුම් පිළියෙල කිරීමේ දිනය දක්වා පැවති අතිකාල දීමනා හා ගමන් වියදම් රු. 63,030 ක් 2021 අවසන් ගිණුම් මගින් මූල්‍ය ප්‍රකාශන වල ජංගම බැරකම් යටතේ පෙන්නුම් කිරිමට කටයුතු කර ඇත. | සමාලෝචිත වර්ෂයට අදාලව දරන ලද සියළුම වියදම් ගිණුම්ගත කලයුතුයි |
| (ඇ) | 2021 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සමීක්ෂණයක් සිදුකර ඇතත් අරමුදලට අදාලව ඇති වත්කම් හඳුනාගත හැකිවන පරිදි සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. ඒ අනුව රු. 30,953,398 ක් වූ වත්කම් (නීලාවේලි හැර) සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය. | 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ කටයුතු ඉදිරියේදී සිදු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | අරමුදලට අදාලව ඇති වත්කම් හඳුනාගත හැකිවන පරිදි සමීක්ෂණ වාර්තා ඉදිරිපත් කල යුතුයි. |
| (ඈ) | 2021 වර්ෂයේ කොවිඩ් සහනාධාර ලබාදීම සඳහා දෙපාර්තමේන්තුවට අවශ්‍ය මුදල් ලබාදීමට අරමුදල සතු එකතු වටිනාකම රු. 2,848,689,752 ක් වූ ආයෝජන සහතික 2 ක් ඇපයට තබා ණය මුදලක් ලබාගෙන තිබුණි. මේ ණය මුදල් ලැබීම සහ දෙපාර්තමේන්තුවට ගෙවීම පිළිබඳ වත්කම් හා බැරකම් වල ගිණුම්ගත කර නොතිබුණ අතර ගිණුම් සටහන් මගින් ද හෙළිදරව් කර නොතිබුණි. 2023 මාර්තු මස වන විට වර්ෂ 02 ක් ඉක්මවා ඇතත් ණය මුදල් පියවීමට දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබීම හේතුවෙන් ස්ථාවර තැන්පතු නිදහස් කර ගැනීමට නොහැකි වී තිබුණි. | සමාජ ආරක්ෂණ අරමුදලින් ලංකා බැංකු ශාඛාවේ ස්ථාවර තැන්පත් දෙකක් බැංකු සුරැකුම් ලෙස තබාගෙන මෙම ණය මුදල ලබාගෙන ඇත්තේ සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව විසිනි. එබැවින් සමාජ ආරක්ෂණ අරමුදලේ ගිණුම් තුල වත්කම් හා බැරකම් ලෙස ගිණුම්ගත කර නොමැත. | අරමුදලේ වත්කම් හා බැරකම් වශයෙන් ගිණුම්ගත කල යුතුයි. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. 135 හා මු.රෙ 381 (1) | නිලාවෙලි පුහුණු මධ්‍යස්ථානයේ සියළුම කාර්යයන් මූල්‍ය පාලන බලතල පවරාදිමකින් තොරව සිදුකර තිබූ අතර 2017 වර්ෂයේ සිට බැංකු ජංගම ගිණුමක් පවත්වාගෙන ගොස් තිබුණ ද විගණිත දින දක්වා භාණ්ඩාගර අනුමැතිය ලබාගෙන නොතිබුණි. | මේ සම්බන්ධයෙන් නිලාවෙලි පුහුණු මධ්‍යස්ථානයන් විමසීම් කර, ඒ සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුයි |
| (ආ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 | ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරිමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රු.25,569,637 ක් වූ භාණ්ඩ මිලදී ගැනීම් හා රු. 1,390,660 ක් වූ ඉදි කිරීම් සිදු කර තිබුණි. | ඉදිරි මිළ දී ගැනීම් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කිරීමට කටයුතු කරනු ලැබේ. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,518,333,556 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 641,568,935 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 876,764,621 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ප්‍රතිලාභී ගෙවීම් වැඩිවීම හා ආයෝජන පොලී ආදායම අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාජ ආරක්ෂණ කටයුතු වෙනුවෙන් ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත ලබා දීම සඳහා පරිගණක හා උපාංග මිලදී ගැනීමට 2019 ජුලි 08 දින ටෙන්ඩර් කැඳවා තිබුණි. 2020 දෙසැම්බර් 14 දින රු. 9,275,200 ක් වූ පරිගණක උපාංග මිලදී ගැනීම සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා දී තිබුණි. මෙම උපාංග මිලදී ගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත බෙදා දීම 2021 පෙබරවාරි 02 දින සිදුකර ඇතත් ඊට අවශ්‍ය පරිගණක ලබාදීම 2022 පෙබරවාරි 03 දක්වා ප්‍රමාද වී තිබුණි. පරිගණක මිලදී ගැනීම ප්‍රමාද වීම හේතුවෙන් මිලදිගත් පරිගණක උපාංග ආයතනයේ කාර්යයන් සඳහා යොදා ගැනීමට නොහැකිව වසරක කාලයක් නිශ්කාර්යව පැවතුණි. | මෙම කාල වකවානුවේ රට තුල කොවිඩ් වසංගත තත්වය හමුවේ සිදු වූ නොවැලැක්විය හැකි හේතු මත මෙම පරිගණක හා උපාංග මිළ දී ගත් ආයතනය මගින් සිදු වූ ප්‍රමාද හා මෙම පරිගණක 308 ප්‍රාදේශිය ලේකම් කාර්යාල වෙත නිකුත් කිරිමට ප්‍රථම මේවායේ ක්‍රියාකාරත්වය පිළිබඳව පරික්ෂා කර බලා නිකුත් කිරිමට සිදු වීම මෙම ප්‍රමාදයට හේතුව විය. | අවශ්‍යතාවය අනුව මිලදීගැනීම් කර මිල විචලනයන්ට ලක් නොවන පරිදි එම කටයුතු අප්‍රමාදව සිදු කල යුතුයි. |

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන ගිණුම් වර්ෂය අවසන්වී මාස 02 ක් තුළ කාර්යසාධන වාර්තාවක්ද සමඟ මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුවට පිටපතක් සහිතව විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2023 පෙබරවාරි 03 දින විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණි. | 2018, 2019 සහ 2020 වර්ෂවල අවසන් ගිණුම් 2022 මාර්තු 09 වන දින ද 2021 වර්ෂයේ අවසන් ගිණුම 2022 මාර්තු 28 දින ද රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල් වෙත පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ ගිණුම් ඉදිරිපත් කළ යුතුය. |

**4.2 අයවැය පාලනය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුළත් මුදල් රෙගුලාසි 877(1) අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. | සමාජ ආරක්ෂණ අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් 2022 වර්ෂයේ සිට අයවැය ලේඛනය පිළියෙල කිරීමට කටයුතු කර ඇත. | මුදල් රෙගුලාසි හා චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව අදාළ කාලය තුළ අයවැය ලේඛනය සකස් කර ඉදිරිපත් කළ යුතුය. |